පසුගිය වසරේ ශ්‍රී ලංකාව තුළ සිදුවූ බවට පැවසෙන දිවි තොර කරගැනීම් සංඛ්‍යාව 3,074 කි. එනම්, දිනකට දිවි තොර කරගැනීම් 8 කටත් වැඩි සාමාන්‍යයකි. මෙම දිවි තොර කරගැනීම් සෑම එකකටම, දිවි තොර කරගැනීමට තැත් කිරීම් ගණනාවක්ද සිදුවන බව ලෝක සෞඛ්‍ය සංවිධානය කියයි.

දිවි තොර කරගැනීම් වාර්තාකරණයේදී මාධ්‍ය අතිශයින්ම ප්‍රවේසම් සහත සහ ආචාර ධාර්මික විය යුත්තේ, එසේ නොවන විටදී දිවි තොරකරගැනීම් පිළිබඳ වාර්තාවන් ඔස්සේද අනුකාරක දිවි තොර කරගැනීම් සිදුවිය හැකි බැවිනි.

උදාහරණ ලෙසින් පහත දැක්වෙන දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන් දැක්විය හැක.

1) මෙහි දිවි තොර කරගත් ආකාරය දක්වා ඇත. එය අනුකාරක දිවි තොර කරගැනීම් වලට හේතු විය හැක.

2) දිවි තොර කරගත් කාන්තාවගේ ඡායාරූපය දක්වා ඇත. එය දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයකට පත්විය හැකි අයෙකුට පසුකාලීනව හෝ දිවි තොර කරගැනීමකට නැඹුරු වීමට උත්ප්‍රේරකයක් සැපයිය හැක.

3) දිවි තොර කරගත් අය ලියූ ලිපියේ කොටස් පළ කර ඇත. එයද දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයකට පත්විය හැකි අයෙකුට පසුකාලීනව හෝ දිවි තොර කරගැනීමකට නැඹුරු කරවිය හැක.

4) උපකාරක අංක පළ කර නැත. උපකාරක අංක සඳහන් නොකිරීම තුළින්, දිවි තොර කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ දිවි බේරාගැනීමට ඇති හැකියාවක් නොලැබී යා හැක.

මෙම පුවත වාර්තා කළ පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ මෙය ආවරණය වී නොතිබුණි.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://www.police.lk/.../04.Mode-of-suicides---for-Year...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

**#MediaEthicsSL #lka #sinhalanews #Aruna #Silumina #Divaina**